# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2398/14 - 2024 අගෝස්තු මස 21 වැනි බදාදා - 2024.08.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතිය**

84 වගන්තිය යටතේ දැන්වීම

1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 84 වගන්තිය අනුව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු/හා ජාතික ජලසම්පාදන මණ්ඩලය විසින් පවත්වාගෙන යන/ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදුකරනු ලබන මළාපවහන පද්ධතියට/ ජාලයට සම්බන්ධිතව ඇති පාරිභෝගිකයන්ගේ මළාපවහන ගාස්තු 2024 අගෝස්තු 21 වැනි දින සිට පහත පරිදි සංශෝධනය කර ඇත.

2023 අගෝස්තු 02 දිනැති අංක 2343/29 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි 2023 අගෝස්තු 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මළාපවහන ගාස්තු සම්බන්ධයෙන් සඳහන් වන දැන්වීම වෙනුවට මෙම නිවේදනය අදාළ වේ.

**ජීවන් තොණ්ඩමාන්,**
ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය.

2024 අගෝස්තු මස 16 වැනි දින,
ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

1A - G 42528— 09 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඕනෑම පරිශ්‍රයක මාසික මලාපවහන ගාස්තුවට, පරිහරණ ගාස්තුව, මාසික සේවා ගාස්තුව, අනිකුත් ගාස්තු සහ අදාළ බදු ඇතුළත් වේ. ජල බිල්පතෙහි සාමාන්‍යයෙන් සම්පූර්ණ මාසික ජල/මලාපවහන ගාස්තුව දැක්වෙන අතර ඕනෑම පාරිභෝගිකයකුට තම ජල බිල්පතට අමතරව එකතුකළ අගය මත බදු/ අත්හිටවූ එකතුකළ අගය මත බදු ඉන්වොයිසියක් අවශ්‍ය වේ නම්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි පූර්ව ලියාපදිංචි වී එය ලබා ගත හැක.

**සියලුම ජල පාරිභෝගිකයන් පහත වගුවේ දැක්වෙන පාරිභෝගික ප්‍රභේදවලට වෙන්කර ඇත. එමගින් අදාළ වන ගාස්තු අයක්‍රමය පහසුවෙන් හඳුනාගත හැක.**

| *පාරිභෝගික ඛාණ්ඩය* | *පාරිභෝගික ප්‍රභේද අංකය සහ ප්‍රභේදය* | *අදාළ වන ජල ගාස්තු අයක්‍රමය* |
|---|---|---|
| ගෘහ සහ සහාධිපත්‍ය නිවාස | ➢ 10-ගෘහ<br>➢ 11-මණ්ඩල නිල නිවාස<br>➢ 13-රජයේ නිල නිවාස<br>➢ 14-වතු නිවාස (සමෘද්ධිලාභීන් නොවන)<br>➢ 16-මණ්ඩල නිල නිවාස (අඹතලේ)<br>➢ 17-නාගරික සංවර්ධන අධිකාරියට අයත් නැවත පදිංචි කිරීම් සහාධිපත්‍ය නිවාස<br>➢ 18-සහාධිපත්‍ය නිවාස ගෘහ<br>➢ 19-තානාපති නිවාස-එකතු කළ අගය මත බදු අය නොවන<br>➢ 20-ගෘහ සමෘද්ධිලාභීන්<br>➢ 24-වතු නිවාස සමෘද්ධිලාභීන් | අයක්‍රම වගුව 01 |
| රජයට අයත් ව්‍යවසාය ආයතන, වාණිජ ආයතන සහ කර්මාන්ත | ➢ 65-රජයට අයත් ව්‍යවසාය ආයතන<br>➢ 70-වාණිජ ආයතන<br>➢ 71-සංචාරක හෝටල් සහ ආගන්තුක නිවාස<br>➢ 72-නැව් ප්‍රවාහන සේවය<br>➢ 77-මිශ්‍ර සංවර්ධන<br>➢ 78-වරාය නගර<br>➢ 79-තානාපති කාර්යාල - එකතු කළ අගය මත බදු අය නොවන වාණිජ ආයතන<br>➢ 80-වෙනත් වාණිජ හා පෞද්ගලික ආයතන<br>➢ 82-මණ්ඩල පරිශ්‍ර | අයක්‍රම වගුව 02 |
| | ➢ 73-සුළු හා මධ්‍ය පරිමාන නොවන කර්මාන්ත<br>➢ 74- ආයෝජන ප්‍රවර්ධන කලාප කර්මාන්ත<br>➢ 75-සුළු හා මධ්‍ය පරිමාන කර්මාන්ත | |
| රජයේ පාසැල්, රජයේ උපකෘත පාසල්,ආගමික සහ පූජනීය ස්ථාන, රජයේ අනුමත පුණ්‍යායතන සහ වෙනත් ලාභ නොලබන ආයතන | ➢ 12-රජයේ පාසැල්<br>➢ 15-රජයේ උපකෘත පාඨශාලා<br>➢ 81-ආගමික සහ පූජනීය ස්ථාන<br>➢ 85-වෙනත් ලාභ නොලබන ආයතන<br>➢ 88- රජයේ අනුමත පුණ්‍යායතන | අයක්‍රම වගුව 03 |
| රජයේ ආයතන | ➢ 60-රජයේ ආයතන<br>➢ 61-යුධ හමුදා පරිශ්‍ර<br>➢ 62-පොලිස් දෙපාර්තමේන්තු පරිශ්‍ර<br>➢ 63-රජයේ රෝහල්<br>➢ 64-පලාත් පාලන ආයතන පරිශ්‍ර | අයක්‍රම වගුව 04 |

**විවිධ අයකුම සඳහා මළාපවාහන ගාස්තු වගු**

**ගාස්තු අයකුම වගුව I**

**ගෘහ අයකුමය** - ගෘහ කටයුතු සහ සහාධිපත්‍ය නිවාස සඳහා සපයන මළාපවහන සේවා වෙනුවෙන් අයකරන ගාස්තු (ප්‍රභේද 10,11,13,14,16,17,18,19,20,24)

| *ජල පරිභෝජනය (ඝන මීටර)* | *මළාපවහන පරිහරණ අයකුමය (ඝන මීටරයකට) (රු.)* | *සේවා ගාස්තුව (රු.)* |
|---|---|---|
| 0-05 | 10.00 | 250.00 |
| 1-10 | 10.00 | 400.00 |
| 1-15 | 15.00 | 400.00 |
| 1-20 | 22.00 | 500.00 |
| 1-25 | 25.00 | 500.00 |
| 1-30 | 30.00 | 500.00 |
| 1-40 | 35.00 | 600.00 |
| 1-50 | 45.00 | 600.00 |
| 50 ට වැඩි | 55.00 | 900.00 |

**ගාස්තු අයකුම වගුව II**

**වාණිජ අයකුමය** - රජයට අයත් ව්‍යවසාය ආයතන, වාණිජ ආයතන සහ කර්මාන්ත සඳහා සපයන මළාපවහන සේවා වෙනුවෙන් අය කරන ගාස්තු (ප්‍රභේද 65,70,71,72,73,74,75,77,78,79,80,82)

| *ජල පරිභෝජනය (ඝන මීටර)* | *මළාපවහන පරිහරණ අයකුමය (ඝන මීටරයකට) (රු.)* | *සේවා ගාස්තුව (රු.)* |
|---|---|---|
| 00 - 25 | 130.00 | 500.00 |
| 26 - 50 | 130.00 | 1,500.00 |
| 51 - 75 | 130.00 | 3,000.00 |
| 76 - 100 | 130.00 | 4,000.00 |
| 101 - 200 | 130.00 | 7,000.00 |
| 201 - 500 | 130.00 | 10,000.00 |
| 501 - 1,000 | 130.00 | 20,000.00 |
| 1,001 - 2,000 | 130.00 | 30,000.00 |
| 2,001 - 4,000 | 130.00 | 40,000.00 |
| 4,001 - 10,000 | 130.00 | 50,000.00 |
| 10,000 ට වැඩි | 130.00 | 60,000.00 |

ගාස්තු අයකුම වගුව **III**

**පාසැල්, උපකෘත පාසල්, ආගමික හා පූජනීය ස්ථාන, රජයේ අනුමත පුණ්‍යායතන සහ වෙනත් ලාභ නොලබන ආයතන අයකුමය** - රජයේ පාසැල් සහ රජයේ උපකෘත පාසල්, ආගමික හා පූජනීය ස්ථාන, රජයේ අනුමත පුණ්‍යායතන සහ වෙනත් ලාභ නොලබන ආයතන සඳහා සපයන මළාපවහන සේවා වෙනුවෙන් අයකරන ගාස්තු (ප්‍රභේද 12,15,81,85,88)

| *ජල පරිභෝජනය (ඝන මීටර)* | *මළාපවහන පරිහරණ අයකුමය (ඝන මීටරයකට) (රු.)* | *සේවා ගාස්තුව (රු.)* |
|---|---|---|
| 00 - 10 | 88.00 | 500.00 |
| 11 - 15 | 88.00 | 750.00 |
| 16 - 20 | 88.00 | 1,000.00 |
| 21 - 25 | 88.00 | 1,250.00 |
| 26 - 30 | 88.00 | 1,500.00 |
| 31 - 40 | 88.00 | 1,750.00 |
| 41 - 50 | 88.00 | 2,000.00 |
| 51 - 75 | 88.00 | 2,500.00 |
| 75 ට වැඩි | 88.00 | 4,000.00 |

ගාස්තු අයකුම වගුව **IV**

**රජයේ ආයතන අයකුමය** - රජයේ ආයතන සඳහා සපයන මළාපවහන සේවා වෙනුවෙන් අය කරන ගාස්තු (ප්‍රභේද 60,61,62,63,64)

| *ජල පරිභෝජනය (ඝන මීටර)* | *මළාපවහන පරිහරණ අයකුමය (ඝන මීටරයකට) (රු.)* | *සේවා ගාස්තුව (රු.)* |
|---|---|---|
| 00 - 25 | 120.00 | 500.00 |
| 26 - 50 | 120.00 | 1,500.00 |
| 51 - 75 | 120.00 | 3,000.00 |
| 76 - 100 | 120.00 | 4,000.00 |
| 101 - 200 | 120.00 | 7,000.00 |
| 201 - 500 | 120.00 | 10,000.00 |
| 501 - 1,000 | 120.00 | 20,000.00 |
| 1,001 - 2,000 | 120.00 | 30,000.00 |
| 2,001 - 4,000 | 120.00 | 40,000.00 |
| 4,000 ට වැඩි | 120.00 | 50,000.00 |

**කොන්දේසි** :

1. සියලුම ජල ප්‍රභවයන් භාවිතා කරමින් සිදු කරනු ලබන අදාළ මාසයෙහි ජල පරිභෝජනය පදනම් කරගෙන සපයනු ලබන මළාපවහන සේවා වෙනුවෙන් ඉහත පරිදි ගාස්තු අයකරනු ඇත.

2. යම් මාසයක භාවිතය ශුන්‍ය වුවද මාසික මළාපවහන සේවා ගාස්තුව සියලු පරිශ්‍රයන් සඳහා අදාළ වනු ඇත.

3. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙ හි ජල සැපයුමට අමතරව වෙනත් විකල්ප ජල ප්‍රභව කිහිපයක් භාවිත කරන විට ඒ සඳහා පරිහරණ ගාස්තුව වශයෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් පාරිභෝගිකයා විසින් ගෙවීම් කළ යුතු ය.

4. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ජල සැපයුම රහිතව මළාපවහන සේවා පමණක් ලබා ගෙන ඇති විටක මණ්ඩල නිලධාරීන් කණ්ඩායමක් විසින් පාරිභෝගිකයාගේ ද සහභාගිත්වයෙන් කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂාවකින් පසුව තීරණය කරනු ලබන ඇස්තමේන්තු අගයකට මළාපවහන ගාස්තුව නියම කරනු ඇත.

5. **මළාපවහන සේවා ගාස්තු ගෙවීම පැහැර හරිනු ලබන පාරිභෝගිකයන්ගේ සැපයුම විසන්ධි කිරීම** :-

අදාළ මාසයේ ජල ගාස්තු හා මළාපවහන ගාස්තු බිල්පත ලැබී දින 30 ක් ඇතුළත ගෙවීම පැහැර හරිනු ලබන පාරිභෝගිකයන්ගේ ජල සැපයුම සහ/හෝ මළාපවහන සේවාව 1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 88 (I) වගන්තිය අනුව විසන්ධි කිරීම/ මෙහෙයුම් තත්වයෙන් ඉවත්කිරීම කරනු ඇත.

6. මළාපවහන සේවාව මෙහෙයුම් තත්වයෙන් ඉවත් කිරීම කළහොත් එය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා නැවත සම්බන්ධන ගාස්තුවට අමතරව ඒ සඳහා වැයවන පිරිවැය ප්‍රමාණය අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් අදාළ පාරිභෝගිකයා විසින් ගෙවීම් කළ යුතු ය.

7. කර්මාන්ත ශාලාවලින් ගෘහස්ථ ගණයට අයත් නොවන අපජලය කර්මාන්තයට ආවේනික ප්‍රාථමික පිරිපහදුවකින් පසු ගෘහස්ථ අපජලය ගණයට පත්කළ යුතු අතර, එය 2022 ජනවාරි 27 දිනැති පරිසර පනතේ රෙගුලාසි VI - A හා VI - B වගුවට ඇතුළත් පිරිවිතරයන්ට හෝ එකී නීති සම්පාදනය සම්බන්ධයෙන් පසුව සිදුකෙරෙන වෙනත් යම් සංශෝධනයක් වෙතොත් එම සංශෝධනයන්ට අනුකූල විය යුතු ය.

8. **නියෝග උල්ලංඝනය කිරීම** :-

මළාපවහන සැපයුම ලබාදී ඇත්තේ කිසියම් නියෝගයක් යටතේ ද එම නියෝගය කවර හෝ පාරිභෝගිකයකු විසින් උල්ලංඝනය කරනු ලබයි නම් 1974 අංක 02 දරන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල නීතියේ සහ 1992 අංක 13 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල (සංශෝධිත) පනතේ අදාළ විධිවිධාන යටතේ හෝ නීති සම්පාදනය සම්බන්ධයෙන් පසුව සිදුකෙරෙන වෙනත් යම් සංශෝධනයක් හෝ යටතේ කටයුතු කරනු ලැබේ.

EOG 08-0239/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.